නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්

நேஷனல் பேப்பர் கம்பெனி லிமிடட்

National Paper Company Limited

NPCL



වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கைகள்

Annual Report

2018 - 2019

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

Ministry of Industry and Entrepreneurship Development

වාර්ෂික වාර්තා, ගිණුම් ප්‍රකාශණ සහ ස්වාධීන විගණන වාර්තා

නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්

වාර්ෂික වාර්තාව

2019.03.31 දිනෙන් අවසන් වන වසර සඳහා

INDEX

අන්තර්ගතය	පිටු අංක
1. සභාපතිතුමාගේ පණිවුඩය	01
2. වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලය 2025	03
3. දැක්ම සහ මෙහෙවර	05
4. 2019.03.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන	
4.1 සංස්ථාපිත තොරතුරු	09
4.2 අධ්‍යක්ෂවරුන්ගේ වාර්ථාව	10
4.3 විගණකවරුන්ගේ වාර්ථාව සහ මූල්‍ය ප්‍රකාශන	11

உள்ளடக்கம்	பக்க இல.
1. தலைவரின் செய்தி	01
2. பணிப்பாளர் குழாத்தினர் 2025	03
3. இலக்கு மற்றும் நோக்கக் கூற்று	05
4. 2019 மார்ச் 31 உடன் முடிவடையும் வருடத்துக்கான நிதிக் கூற்றுக்கள் பொருளடக்கம்	
4.1 கூட்டிணைக்கப்பட்ட தகவல்கள்	09
4.2 பணிப்பாளர்களின் அறிக்கை	10
4.3 கணக்காய்வாளர்களின் அறிக்கை மற்றும் நிதிக் கூற்றுக்கள்	11

Contents	Page No.
1. Message from the Chairman	01
2. Incumbent Board of Directors 2025	03
3. Vision & Mission	05
4. Financial Statements for the Year Ended 31 March 2019	
4.1 Corporate information	09
4.2 Report from the Directors	10
4.3 Auditors' Report and Financial Statements	11



සභාපතිතුමාගේ පණිවුඩය

සීමාසහිත ජාතික කඩදාසි සමාගම නමින් ශ්‍රී ලංකාවේ කඩදාසි කර්මාන්තයේ නියමුවා ලෙස විරුදාවලිය ලත්, 1956 වසරේ සිට වර්තමානය දක්වා දශක 7කට ආසන්න කාලයක් ජාතික කඩදාසි අවශ්‍යතාවය සපුරාලමින් ඉතා විශාල මෙහෙයක් ඉටු කරනු ලැබූ මෙම ආයතනය 1992 වසරේ රාජ්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලද අතර 1995 සහ 1996 යන වසර වල ජාතික ඵලදායිතා සම්මානයෙන් පිදුම් ලද ආයතනයකි.

2020 වන විට සම්පූර්ණයෙන්ම අකර්මණ්‍යව පැවති චාලව්චේන සහ ඇඹිලිපිටිය කඩදාසි කම්හල් ද්විත්වයට පණ ලබාදෙමින් කටයුතු කල පෙර සභාපති විමල් රූපසිංහ මහතාගේ කාර්‍යභාරය මම ඉතාමත් සතුටින් සිහිපත් කරන අතර මා ඇතුළු වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය 2024 නොවැම්බර් මස සිට පාලනාධිකාරයට පත් වූ අතර දේශයේ කඩදාසි කර්මාන්තය පසුබෑමට ලක්ව ඇති මොහොතක කඩදාසි වෙළඳ පොළ තුල නැවත ස්වයං මූල්‍යනයක් යටතේ ජාතික කඩදාසි සමාගම ස්ථානගත කිරීමට මා හට පැවරුණු අභියෝගය ඉතා සතුටින් භාරගත් අතර නිෂ්පාදන ධාරිතාවද සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිකර ගැනීමට උපායශීලි ක්‍රියාමාර්ග අනුගමනය කර මෙහෙයුම් ලාබයක් ලබාගනිමින් ක්‍රියාත්මක කිරීමට හැකි විය.

මේ වන විට ජාතික කඩදාසි සමාගමේ 2018 සිට 2019 වාර්ෂික මුල්‍ය ප්‍රකාශන සකස් කර විගණනය අවසන් කර ඇත. එය වාර්ෂික වාර්ථාවක් ලෙස සකස් කර ඉදිරිපත් කිරීමට අප වර්තමාන කාර්යය මණ්ඩලයට හැකිවී ඇත. 2014/2015 වර්ශයේ සිට මේ දක්වා වාර්ෂික ගිණුම් සකස් කර නොතිබීමද අපකාර්යය මණ්ඩලයට ලද තවත් අභියෝගයක් වූ අතර 2020 වර්ෂයේ සිට වාර්ෂික අවසාන ගිණුම් සහ වාර්ෂික වාර්ථා ක්‍රමානුකූලව නිසි පරිදි සකස් කල යුතු බැවින් පසුගිය දත්ත මත පදනම්ව ඉතාමත් කෙටි කලක් ඇතුලත 2018/2019 වර්ෂයෙහි වාර්ෂිත වාර්ථාව සකස් කොට අවසන්කර මෙසේ ඉදිරිපත් කිරීම, මාගේ ධුර කාලය තුල මා භාර ගත් අවිනිශ්චිත වගකීමක් වන අතර අප සතුව තිබූ දත්ත ඇසුරෙන් මෙම වාර්තාව හෝ ඉදිරිපත් කිරීමට හැකිවීම සම්බන්ධයෙන් මා සතුටට පත්වෙමි.

අතීතයේ පැවැති විවිධ හැලහැප්පීම් බාධක පරයමින් වර්ථමාන තරගකාරී වෙළඳ පොළ තුල යලි ජාතික කඩදාසි සමාගමේ ස්වාධිපත්‍ය පතුරුවාලීමට අවශ්‍ය සියළු ආකාරයේ තීන්දු තීරණ ගනිමින් සෑම අවස්ථාවකම මා දිරි ගන්වමින් සහ සහයෝගය ලබා දෙමින් කටයුතු කරනු ලබන ගරු අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ඇතුළු එම කාර්යය මණ්ඩලය මෙන්ම මහා භාණ්ඩාගාරයේ නිලධාරී මඩුල්ලද ඉතාමත් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

එමෙන්ම ආයතනයේ ක්‍රියාකාරකම් නිරතුරුව අධීක්ෂණය කරමින් අවශ්‍ය මග පෙන්වීම ලබා දෙමින් අප කෙරේ විශ්වාසයෙන් යුතුව කටයුතු කරන අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුළු කාර්‍යමණ්ඩලය සහ අප සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය දේශීය කඩදාසියේ අනාගතය ගොඩනගන්නට මා වෙත ලබා දෙන මහගු ශක්තියද ගෞරවයෙන් සිහිපත් කරන අතර කඩදාසි කර්මාන්තයේ පෙරගමන්කරුවන් ලෙස ශක්තිමත්ව සාමූහිකව මා සමග අත්වැල් බැඳගනිමින් ජාතික කඩදාසි සමාගමේ උන්නතිය උදෙසා කැපවන සමාගමේ සේවක මඩුල්ලද ඉතාමත් සතුටින් හෘද්‍යාගමව සිහිපත් කරමි.

ඉංජිනේරු ආර්.එම්.එස්.උපාලිරත්නායක
සභාපති
ජාතික කඩදාසි සමාගම

2025

සභාපතිතුමා ඇතුළු වර්ථමාන අධ්‍යක්ෂ මණ්ඩලය



ඉංජිනේරු ආර්.එම්.එස්. උපාලි රත්නායක මහතා
සභාපති



ඉංජිනේරු ඩබ්ලිව්.ඒ කුලතිලක මහතා
අධ්‍යක්ෂක




ඉංජිනේරු කමලනාත් ජිනදාස මහතා
අධ්‍යක්ෂක



ඉංජිනේරු එන්.ඒ. නන්දසේන මහතා
අධ්‍යක්ෂක



ඉංජිනේරු නිහාල් පෙරේරා මහතා
අධ්‍යක්ෂක



ජේ.ඩී. කොටින්කඩුව මහත්මිය
අධ්‍යක්ෂිකා



දිනිදු මුනිදාස මහතා
අධ්‍යක්ෂක

සංස්ථාපිත දැක්ම සහ මෙහෙවර

අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ කඩදාසි කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා දායකවීම පිණිස, වර්තමානයේ නිෂ්පාදනය නොකරන මුද්‍රණ කඩදාසි ඡායා පිටපත් කඩදාසි සහ පරිගණක ලිපිද්‍රව්‍ය වැනි කඩදාසි සහ වෙනත් බෝඩ් (පුවරු) නිෂ්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අලෙවිකරණයේ පෙරගමන්කරුවකු වීම.

අපගේ මෙහෙවර

ඉතා ලාභදායී පරිසර හිතකාමී ගනුදෙනුකරුවන් මූලික කරගත් තාක්ෂණය, මානව සම්පත් සහ විශිෂ්ඨ කළමනාකරණයක් ඇති සියළුම වර්ගවල කඩදාසි සහ බෝර්ඩ් (පුවරු) නිෂ්පාදනය කරනු ලබන සහ අලෙවි කරනු ලබන අතිශයින් නවෝත්පාදනය සහ විවිධාංගිකරණය කළ කඩදාසි සමාගමක් බවට පත්වීම.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

අන්තර්ගතය

2018/2019 මූල්‍ය වර්ෂය

1. සංස්ථාපිත තොරතුරු

2. අධ්‍යක්ෂවරුන්ගේ වාර්ථාව

3. විගණකවරුන්ගේ වාර්ථාව සහ මූල්‍ය ප්‍රකාශන

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

සංස්ථාපිත තොරතුරු : 2018/2019

නිසි බළධාරි - කේ.එම්.එස් කන්දෙගෙදර මහතා

<u>සමාගම් ලේකම්වරු</u>

ඩී.එම්.ජේ මැනේජ්මන්ට් ඇන්ඩ් සෙක්‍රටේරියට් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 20/26

දුම්රියපොළ පාර

නුගේගොඩ

<u>ලියාපදිංචි කාර්යාලය</u>

අංක 93, ජාවත්ත පාර

කොළඹ - 05

<u>විගණකවරු</u>

ජාතික විගණක කාර්යාලය

306/72 පොල්දූව පාර

බත්තරමුල්ල

<u>බැංකුකරුවෝ</u>

මහජන බැංකුව

ලංකා බැංකුව

<u>අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව</u>

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් සහිත වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරයි.

1. ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම්

සමාගමේ ප්‍රදාන මෙහෙයුම් ක්‍රියාකාරකම වන්නේ කඩදාසි සහ කඩදාසි පුවරු (පේපර් බෝර්ඩ්) වාලව්වේන කර්මාන්තශාලාවෙහි නිෂ්පාදනය කර ආලවි කිරීමයි.

2.කොටස් ප්‍රාග්ධනය

සීමාසහිත ජාතික කඩදාසි සමගම මහාභාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ 100% කොටස් අයිතියකින් යුක්ත රාජ්‍ය අයිතිය සතු ව්‍යාපාර එකකියකි. එහි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 323කි. (එනම් කොටස් ප්‍රාග්ධනය රුපියල් 10/- බැගින් වූ කොටස් 32,300,000 කින් සමන්විත වේ.)

3.පිරිවැටුම

2019.03.31 දිනෙන් අවසාන ගිණුම් වර්ෂයේ සමාගමේ ශුද්ධ පිරිවැටුම රුපියල් මිලියන 4.533Mn කි.

4. සමාගමේ නිෂ්පාදන පිරිවැය 2.1Mn

සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුල වාලව්වේන කම්හලෙහි නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන, 4.56 කි.

5. ප්‍රාග්ධන වියදම්

සීමාසහිත ජාතික කඩදාසි සමාගම ප්‍රතිව්‍යුහකරණයට වෙන්වූ දින සිට ප්‍රාග්ධන වියදම් ඉතා අල්ප ප්‍රමාණයකට සීමා කරන ලදී.

6. සමගම සම්බන්ධයෙන් ගිවිසුම් වලට එළඹීමට අධ්‍යක්ෂවරුන් දැක්වූ ඇල්ම

2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේදී සමාගමේ අධ්‍යක්ෂවරු සෘජුව හෝ වක්‍රාකාරව සමාගම සමග ගිවිසුම් වලට එළඹීමට නොහැක.

7.විගණකවරු

සමාගමේ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය කරන ලද්දේ වරලත් ගණකාධිකාරිවරුන් වන ජාතික විගණන කාර්යාලය විසිනි.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

2019 මාර්තු 31

මූල්‍ය ප්‍රකාශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAM/D/NPC/2025/05

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 සැප්තැම්බර් 13 දින

සභාපති

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වන විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ජී.ඒ.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

පිටපත් :-

01. ලේකම්, කර්මාන්ත ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
02. ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. CAM/D/NPCSL/2024/293 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 සැප්තැම්බර් 13 දින

සභාපති

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රමිතයකින් අවසර දී ඇත්නම් මිස, කිසිදු විට අදායම් හා වියදම් ද වත්කම් හා වගකීම්ද එකිනෙකට හිලව් කිරීම නොකළ යුතු වුවත්, සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී රු.43,153,550 ක වත්කම් රු.10,170,405 ක වගකීම් සමඟ හිලව් කර ශුද්ධ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

පිටුව 1 | 7

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 ට අනුව සමාගම විසින් 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම් ගණනය කිරීම සහ විලම්බිත බදු ගණනය කිරීම සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව ඉඩම් පිරිවැය වෙනමද, ගොඩනැගිලි පිරිවැය වෙනමද, මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුතු වුවද සමාගමේ දේපල පිරියත සහ උපකරණ යටතේ ඉඩම් සහ ගොඩනැගිලි පිරිවැය වෙන වෙනම හඳුනානොගෙන රු.132,274,693 ක් ලෙස තනි අගයක් දක්වා තිබුණි.

(ඇ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 148 වගන්තිය පරිදි සමාගමේ ගනුදෙනු නිවැරදි ලෙස වාර්තා කරන හා පැහැදිලි කරන ගිණුම් වාර්තා සහ ආධාරක ලියවිලි තබාගත යුතු වුවද ගිණුම් කාල පරිච්ඡේදයට අදාල ගනුදෙනු හා සිද්ධි සම්බන්ධ ප්‍රමාණවත් ගිණුම් පොත් පත් සහ ගිණුම්කරණ සාක්ෂි ආරක්ෂිතව තබාගැනීම සඳහා සමාගමේ නිසි බලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාගමේ මෝටර් රථ සඳහා ක්ෂය වෙන්කිරීම රු.3,851,831 ක් සහ පරිගණක සඳහා ක්ෂය වෙන්කිරීම රු.220,701 ක්, උපයෝගිතා අයිතම ක්ෂය වෙන්කිරීම රු. 220,802 පිරිවැය වටිනාකම ඉක්මවා ගණනය කර තිබීම හේතුවෙන් වාර්ෂික ලාභය රු. 4,293,334 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඊ) විකුණුම් පිරිවැය තුළ ඉවතලන කඩදාසි මිළදී ගැනීම රු.160,680 ලෙස සටහන් කර තිබුණද, සටහන් අංක 14 යටතේ එයට අනුරූප විකුණුම් ආදායම රු. 16,908,326 ක් විය. ඒ අනුව වර්ෂයට අදාලව සිදුකල සියළු ඉවතලන කඩදාසි මිළදී ගැනීම් සහ විකිණීම් සටහන් වී තිබුණද යන්න පරීක්ෂා කිරීමට විගණනය කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි.

(උ) සමාගමේ ගනුදෙනු පවත්වාගෙන යන ලංකා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී අනාවරණය වූයේ අවස්ථා 6 කදී මුදල් වෙක්පත් නිකුත් කිරීම මගින් ද බැංකුවේ ඇති මුදල් ලබාගෙන ඇති බවයි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී මෙම මුදල් ගනුදෙනු සම්බන්ධව කටයුතු කළ නිසි බලධාරී සහ කාර්යය මණ්ඩලය කවුරුන්ද යන්න පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවූ අතර බැංකු ගනුදෙනු සිදු කිරීම සඳහා බලයලත් නිලධාරීන් කවුරුන්ද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

පිටුව 2 | 7

(ඒ) සමාගමේ ලංකා බැංකුවේ ඇති 164807 දරන ජංගම ගිණුමෙහි ඇති ශේෂයෙන් මුදල් සොයන් ශේෂයන් සංසන්දනය කිරීම සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කර නොතිබුණි.

(එ) රු.11,488,856 ක් වූ වියදම් ගිණුම් ශේෂ 10 ක් ද, රු.484,423,303 ක දේපළ පිරියත උපකරණ, රු. 37,428,597 ක කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධනය, රු. (1,967,061) ක දීර්ඝ කාලීන ආයෝජන, රු.121,646,480 ක අවසන් තොගය, රු.107,406,087 ක වෙළඳ ලැබිය යුතු දා, රු.488,503,353 ක වෙනත් ලැබිය යුතු දා, රු.32,002,887 ක මුදල් සහ මුදල් සමාන දා, රු.159,958,713 ක පොලී සහිත ණය, රු.1,553,398 ක මූල්‍ය කල්බදු වගකීම, රු.134,706,146 ක වෙළඳ ගෙවිය යුතු දා, රු.1,485,771,350 ක වෙනත් ගෙවිය යුතු දා, රු.13,153,368 ක බැංකු අයිරාව, රු.32,742,616 ක පාරිතෝෂික ගෙවීම් සහ රු.45,538,391 ක ව්‍යවස්ථාපිත ගෙවීම් ලෙස එකතුව රු.3,158,290,607 ක් වූ ගනුදෙනු සහ ගිණුම් ශේෂ නහවුරු කරගැනීමට අවශ්‍ය සාක්ෂි සහ මුදල් පොත පරීක්ෂා කිරීමේදී වටිනාකම රු.22,211,233 ක් වූ ලැබීම් ගනුදෙනු සහ වටිනාකම රු. 20,030,784 ක් වූ ගෙවීම් ගනුදෙනුවලට අදාලව සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කළමනාකාරිත්වය අපොහොසත් වී තිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් නහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

පිටුව 3 | 7

ඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැඩීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සමාගම තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම් කොටසේ 1.3 (අ) , (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණවත් කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) 2015 පෙබරවාරි 09 දිනට ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවීමට නියමිතව තිබූ හිඟ විදුලි බිල වූ රු.483,997,075 ක් නොගෙවීම නිසා එදින සිට වාලවේවෙන කර්මාන්තශාලාවට විදුලිය සැපයීම තාවකාලිකව විසන්ධි කර තිබූ අතර විදුලි සැපයුම නොමැති හෙයින් 2020 ජුනි මාසය දක්වා වාලවේවෙන කර්මාන්තශාලාවේ කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදුවී නොතිබුණි. කෙසේ වුවද, 2022 සැප්තැම්බර් 08 දිනැති, අංක EP/EE(COM)/CS/BulkSupply දරන ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරුගේ ලිපියට අනුව හා 2020 මාර්තු 26 දිනැති, අංක අමප/20/0561/224/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින්, රු. 361,992,685 ක් වූ දඩ පොලිය කපා හැරීමෙන් පසුව ඉතිරි වූ රු.122,004,390 ක හිඟ විදුලිබිල කම්හලෙහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කරන දින සිට වසර දෙකක කාල සීමාවක් ගතවීමෙන් පසුව එළඹෙන මාස හයක කාලසීමාව තුළ වාරික වශයෙන් ගෙවා අවසන් කිරීමේ කොන්දේසියට යටත්ව අනුමැතිය ලබාගෙන, 2020 ජූලි මාසයේ දී කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කර තිබුණි. කෙසේ වුවද, 2025 අප්‍රේල් 30 දින වන විට කඩදාසි සමාගම විසින් හිඟ විදුලි බිල වූ රු.111,004,390 ක වටිනාකමක් ගෙවිය යුතුව තිබුණි.

2020 ජූලි මස සිට සමාගමේ ප්‍රධාන කාර්යාලයේ ස්ථිර පදනම මත බඳවාගත් සේවකයින් 08 ක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 23 ක් ලෙස සේවකයින් 31 දෙනෙකු සහ වාලවේවෙන කම්හලෙහි කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 13 ක් ද, දෛනික වැටුප් පදනම මත බඳවාගත් සේවකයින් 6 ක් සහ, පැය අනුපාත අනුව බඳවාගත් සේවකයින් 132 ක් ලෙස සේවකයින් 151 දෙනෙකු ඇතුළුව සමාගමෙහි මුළු සේවක සංඛ්‍යාව 182 ක් විය. නමුත් නැවත ආරම්භයේ සිට වර්ෂ හතරක් අඛණ්ඩව ව්‍යාපාර කටයුතු මෙම කාර්ය මණ්ඩලය සමග පවත්වාගෙන ගියද, නියමිත සේවක සංඛ්‍යාවක් (Cadre) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දී නොතිබුණි.

(ඇ) කම්හලේ නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කිරීමට කඩදාසි නිෂ්පාදන යන්ත්‍රය (Paper Machine) සහ බෝඩ් නිෂ්පාදන යන්ත්‍රය (Board Machine) ලෙස ප්‍රධාන යන්ත්‍ර 02ක් පැවතුණි. 2020 වර්ෂයේ නැවත වාලවේවෙන කඩදාසි කම්හලේ නිෂ්පාදන කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කරගෙනයාමේදී බෝඩ් නිෂ්පාදන යන්ත්‍රයේ අක්‍රිය වන සහ යාන්ත්‍රික දෝෂ ඇති වන අවස්ථා වලදී, නිසි ක්‍රියාකාරිත්වය සඳහා කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයෙන් කොටස් ගලවා බෝඩ් නිෂ්පාදන යන්ත්‍රයට සවිකිරීම සමාගමේ කළමනාකාරිත්වය අනුගමනය කළ ක්‍රමය විය. විගණනයට නිරීක්ෂණය වූ පරිදි, කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයෙන් ප්‍රධාන අයිතම 08 ක් බෝඩ් නිෂ්පාදන යන්ත්‍රයට සවිකර ඇති අතර ඒවාහි වටිනාකම රු.34,433,059 ක් විය. ඒ අනුව, විගණිත දිනය වූ 2025 පෙබරවාරි 20 දින වන විටත් කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයෙන් කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි මට්ටමින් අක්‍රීයව පැවතී අතර කඩදාසි නිෂ්පාදනය සඳහා වර්තමානයේදී භාවිතා කරනුයේ බෝඩ් නිෂ්පාදන යන්ත්‍රය පමණක් බව නිරීක්ෂණය විය.

(ඈ) 2011 දෙසැම්බර් 19 දිනැති අංක 1037 දරන බදු ගිවිසුම අනුව ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව නැවත ප්‍රකෘති තත්වයට පත් කිරීමට හා නැවත සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 600 ක ප්‍රතිෂ්ඨාවකට වර්ෂ 30 ක කාලයක් සඳහා රාජ්‍ය සම්පත් කළමනාකරණ සමාගම සහ සීමාසහිත ජාතික කඩදාසි සමාගම යන ආයතන යුගලය සහ සීමාසහිත පර්ත් ඉංජිනේරු හා මේන්ටෙනන්ස් (පුද්ගලික) සමාගම සමග ගිවිසුම් ප්‍රකාරව එකඟවූ රු. මිලියන 600 ක ප්‍රතිෂ්ඨාවෙන් රු. මිලියන 200 ක් බදුකරු විසින් ගෙවා නොතිබුණි. තවද, අදාල සමාගම විසින් සුළු කාලයක් නිෂ්පාදන කටයුතු සිදුකර ඇති අතර පසුව ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව සතු කඩදාසි නිෂ්පාදන යන්ත්‍රය සෙලාන් බැංකුව වෙත රු.418,483,037 ක වටිනාකමකට උකස් තබා 2012 වර්ෂයේදී කම්හල හැර යාමට කටයුතු කර තිබුණි.

ඒ අනුව, නිසිපරිදි බදු චාරික නොගෙවීම මත රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් නීතිපති උපදෙස් මත අදාළ බදු ගිවිසුම 2014 සැප්තැම්බර් 25 දින අවලංගු කර තිබුණද 2011 දෙසැම්බර් 19 දින සිට ගිවිසුම අවලංගු කල කාලය වූ 2014 සැප්තැම්බර් 25 දක්වා වූ වර්ෂ

තුනක කාලපරිච්ඡේදය වෙතුවෙන් ලැබිය යුතු රු. මිලියන 42 ක බදුකුලිය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

එසේම නිෂ්පාදන යන්ත්‍ර සෙලාන් බැංකුව වෙත උකස් තැබීම සඳහා ජාතික කඩදාසි සමාගම නියෝජනය වන පරිදි ගිවිසුමට එළඹී පාර්ශවයන්ගෙන් සමාගමට සිදුවූ අලාභය අයකර ගැනීමට රාජ්‍ය සම්පත් කළමනාකරණ සමාගම කිසිදු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, ගිවිසුමට එලඹුණු සීමාසහිත පර්ත් ඉංජිනේරු හා මේන්ටෙනන්ස් (පුද්ගලික) සමාගම නිෂ්පාදන කටයුතු නතර කිරීම හේතුවෙන් ගිවිසුම කඩවීම පිළිබඳව, බදුදීමනාකාර පාර්ශවය වූ රාජ්‍ය සම්පත් කළමනාකරණ සමාගම විසින් කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයේදී සීමාසහිත පර්ත් ඉංජිනේරු හා මේන්ටෙනන්ස් (පුද්ගලික) සමාගම බදු ගිවිසුම කඩකර ඇඹිලිපිටිය කම්හල හැර යාමෙන් පසු නැවත 2022 මාර්තු 09 දිනැති බදු ගිවිසුම යටතේ දෙවනි බදුකරු වූ කේඑස්පීඒ ඇඹිලිපිටිය කඩදාසි කම්හල් (පුද්ගලික) සමාගම (KSPA Ambilipitiya Paper Mills private limited) වෙත, රු.මිලියන 260 ක ප්‍රතිශ්‍යාවක් මත වසර 30 ක කාලයකට බදු දී ඇත. ගිවිසුම අනුව මාස 18 ක් තුළ නිෂ්පාදන කටයුතු ආරම්භ කළ යුතු අතර එම කාලසීමාව තුලදී රු.13,000,000 ක වාර්ෂික බදුකුලී වාරිකයක් බදුගැනුම්කරු විසින් සමාගමට ගෙවිය යුතුය. නිෂ්පාදන කටයුතු ආරම්භ කළ පසු බදු ගිවිසුම අනුව විකුණුම් ආදායම මත සියයට 3 කට සමාන වටිනාකමක් වාර්ෂික බදුකුලී වාරිකය ලෙස ගෙවිය යුතුය. ඒ අනුව කේඑස්පීඒ ඇඹිලිපිටිය කඩදාසි සමාගම විසින් 2024 අප්‍රේල් 18 දින නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබුණද ගිවිසුම ප්‍රකාරව බදු කුලිය අය කර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

(ඊ) වර්ෂ හයකට වැඩි කාලයක සිට පැවත එන රු. 42,450,103 ක ණයගැති ශේෂ සහ කාල විශ්ලේෂණයන් නොමැති රු.67,785,219 ක ණයගැති ශේෂ අයවිය යුතු පාර්ශව හඳුනා ගැනීමට හා අයකර ගැනීමට සමාගම කටයුතුකර නොතිබුණි.

(උ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වසර තුනක කාලයක සිට නොවෙනස්ව පැවත එන රු.275,435,666 ක වටිනාකමක් ඇති වත්කම් ගිණුම් ශේෂ සහ රු 1,451,731,125 ක වටිනාකමක් ඇති වගකීම් ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීම සඳහා සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

ඒ.එච්.ඒ ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

පිටුව 7 | 7

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශය

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	සටහන්	*2019*	*2018*
		රු.	*රු.*
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	7	30,524,465	35,847,007
ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ		37,428,597	37,428,597
දීර්ඝ කාලීන ආයෝජන	8	(1,967,061)	(1,967,061)
		65,986,000	71,308,543
ජංගම වත්කම්			
ඉන්වෙන්ටරි	9	121,646,480	120,820,606
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු	10	595,909,440	589,018,137
මුදල් සහ මුදල් සමාන දෑ	11	32,002,887	29,816,388
		749,558,807	739,655,131
මුළු වත්කම්		**815,544,807**	810,963,674
ස්කන්ධය සහ බැරකම්			
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	12	323,000,000	323,000,000
විදේශ ප්‍රදාන		41,777,052	41,777,052
ප්‍රාග්ධන සංචිතය		45,087,534	45,087,534
රඳවාගත් පාඩු		(1,467,743,760)	(1,468,939,085)
		(1,057,879,175)	(1,059,074,500)
ජංගම නොවන බැරකම්			
පොළිය - ධාරක ණය සහ ණය ගැනුම්	13	161,512,110	161,512,110
ජංගම බැරකම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	14	1,666,015,887	1,662,630,179
රජයට ගෙවිය යුතු	15	32,742,616	32,742,616
බැංකු අයිරා	16	13,153,368	13,153,268
		1,711,911,872	1,708,526,063
මුළු ස්කන්ධය සහ බැරකම්		**815,544,807**	810,963,674

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි.
මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා පූර්ණ සංඛ්‍යාත්මක කොටසක් සකස් කරයි.

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ.
මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කරන ලදි.

.....

අධ්‍යක්ෂ

2021 අගෝස්තු 30

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

ලාභ හෝ පාඩු ප්‍රකාශය

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	සටහන්	*2019* රු.	*2018* රු.
ආදායම	1	4,533,700	322,389
විකුණුම් පිරිවැය	2	(4,563,480)	(807,850)
දළ ලාභය		**(29,780)**	(485,461)
වෙනත් ආදායම්	3	17,999,314	25,786,507
පරිපාලන වියදම්	4	(14,855,689)	(16,096,153)
විකුණුම් සහ බෙදා හැරීමේ වියදම්	5	(1,885,206)	(2,035,046)
වසර සඳහා මෙහෙයුම් ලාභය		**1,228,638**	7,169,847
මූල්‍ය පිරිවැය	6	(33,313)	(34,055)
බදු පෙර ලාභය / (පාඩුව)		1,195,325	7,135,792
ආදායම් බදු වියදම්		-	-
වසර සඳහා ශුද්ධ ලාභය/ (පාඩුව)		**1,195,325**	7,135,792

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි.
මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා පූර්ණ සංඛ්‍යාත්මක කොටසක් සකස් කරයි.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	*විදේශ පුදාන*	*ප්‍රාග්ධන සංචිත*	*රඳවාගත් පාඩු*	*Total*
2017 මාර්තු 31 දිනට ශේෂය	323,000,000	41,777,052	45,087,534	(1,476,074,877)	(1,066,210,292)
වසර සඳහා ශුද්ධ ලාභය/(පාඩුව)	-	-	-	7,135,792	7,135,792
2018 මාර්තු 31 දිනට ශේෂය	323,000,000	41,777,052	45,087,534	(1,468,939,085)	(1,059,074,500)
වසර සඳහා ශුද්ධ ලාභය/(පාඩුව)	-	-	-	1,195,325	1,195,325
2019 මාර්තු 31 දිනට ශේෂය	**323,000,000**	**41,777,052**	**45,087,534**	**(1,467,743,760)**	**(1,057,879,175)**

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි.
මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා පූර්ණ සංඛ්‍යාත්මක කොටසක් සකස් කරයි.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

මුදල් ප්‍රවාහ ප්‍රකාශ

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	2019	*2018*
	Rs.	Rs.
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ		
බදුකරණයට පෙර ශුද්ධ ලාභය / (පාඩු)	1,195,325	7,135,792
ගැලපීම :		
ක්ෂය වීම	5,322,543	5,322,543
මූල්‍ය පිරිවැය	33,313	34,055
	6,551,181	12,492,390
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
ඉන්වෙන්ට්‍රිවල (වැඩිවීම)/අඩුවීම	(825,874)	200,000
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම)/අඩුවීම	(6,891,302)	(35,813,524)
දිගු කාලීන ආයෝජන වල (වැඩිවීම)/අඩුවීම	-	-
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වල වැඩිවීම/(අඩුවීම)	3,385,709	14,686,666
රජයට ගෙවිය යුතු දෑ වල වැඩිවීම/(අඩුවීම)	-	460,784
	2,219,713	(7,973,684)
ගෙවූ මූල්‍ය පිරිවැය	(33,313)	(34,055)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**2,186,400**	(8,007,739)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත සහ උපකරණ අත්කර ගැනීම	-	-
ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**-**	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
ලැබුණු ණය	-	-
දීර්ඝ කාලීන ණය නැවත ගෙවීම	-	(181,340)
ගෙවූ බදු කුලී	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**-**	(181,340)
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	**2,186,400**	(8,189,079)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	16,663,119	24,852,199
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ	**18,849,519**	16,663,119
මුදල් සහ මුදල් සමාන දෑ විශ්ලේෂණය		
මුදල් සහ මුදල් සමාන දෑ *(සටහන - 11)*	32,002,887	29,816,388
බැංකු අයිරාව *(සටහන - 16)*	(13,153,368)	(13,153,268)
	18,849,519	16,663,119

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා පූර්ණ සංඛ්‍යාත්මක කොටසක් සකස් කරයි.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

1 සංස්ථාපිත තොරතුරු

1.1 සාමාන්‍ය

සීමාසහිත ජාතික කඩදාසි සමාගම, ("සමාගම") 1992 ජූලි 01 දින සිට ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර පවත්වාගෙන යන පූර්ණ අයිතිය සහිත රජයේ සීමිත වගකීම් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක.93, ජාවත්ත, කොළඹ 05 ලිපිනයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්හි ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ කඩදාසි සහ සන කඩදාසි සෑදීමයි.වසර තුලදී සමාගම ප්‍රධාන මෙහෙයුමෙහි ක්‍රියාත්මක නොවිණි.

1.3 නිකුත් කිරීම සඳහා බලය ලබා දීම

2015 මාර්තු 31 දිනෙන් අවසන් වන වසර සඳහා නෑෂනල් පේපර් කම්පැනි ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශ, නිකුත් කිරීම සඳහා නිසි බලධාරියා විසින් 2018 නොවැම්බර් 05 දින බලය ලබා දෙන ලදි.

1.4 අඛණ්ඩභාවය

2015 **මාර්තු** 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සමාගම රුපියල් 123,638,759/-ක ශුද්ධ අලාභයක් ලබා ඇති අතර (2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී රුපියල් 209,226,700/-ක්) සහ, එම දිනය වන විට සමාගමේ වත්මන් වගකීම් රු. 1,015,079,581/- කින් වත්මන් වත්කම් ඉක්මවා යන අතර (2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුල රු. 950,100,134/-) එහි මුළු වගකීම් එහි මුළු වත්කම් රු. 1.090,931,586/- (2014 මාර්තු 31 න් අවසන් වූ වසර තුල රු. 967,396,084/-) න් ඉක්මවා යයි. තවද වසර තුල රු. 168,212,636/-ක දළ අලාභයක් සිදු වූ වසර තුලදී සමාගම ප්‍රධාන ව්‍යාපාරය මෙහෙයවා නොමැති අතර (2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා රු. 181,946,583/-) අමාත්‍යාංශය විසින් ලබා දෙන මූල්‍ය ආධාර මත දැඩි ලෙස රඳා පවතී. මෙම සාධක මගින් සමාගම තව දුරටත් පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් මතු කරයි.

2 2 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හි සාරාංශය

2.1 2 ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ වාර්තා කරන කාල පරිච්ඡේදය අවසානයේ ස්වාධීනව පනවනු ලබන වටිනාකම ගණනය කිරීම සඳහා භාවිතා කරන බදුකරණ බලධාරීන්ගේ බදු අනුපාත සහ බදු නීති සඳහා අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන මුදලෙනි.

2.2 විලම්බිත බදු

බදු පාඩු හේතුකොට ගෙන විලම්බිත බදුකරණය සපයා නොමැත.

2.3 මුදල් සහ මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි අභිප්‍රාය සඳහා බැංකුවේ සහ අත ඇති මුදල් වලිනි.

2.4 දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාශ කෙරෙනුයේ එදිනෙදා සේවා පිරිවැය , සමුච්චිත ක්ෂය අඩු සහ වටිනාකමේ සමුච්චිත හානි වීම ඉවත් කරමිනි. එම පිරිවැයට ඇතුලත් වනුයේ පිරියත සහ උපකරණයන් හි කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය දැරීමට සිදු වීමේදී හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ වේ නම් ය.

ක්ෂය වීම ගණනය කරනුයේ සෘජු මාර්ග පදනමකින් වත්කම් වල ඵලදායි ජීව කාලය මතය.එක් එක් දේපල,පිරියත සහ උපකරණ සඳහා යොදවන අනුපාත පහත දැක්වේ :

ඉඩම් සහ ගොඩනැගිලි	වසර 40
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	වසර 10
මෝටර් රථ	වසර 4
යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	වසර 15
ක්‍රියාවලියට අයත් දෑ	වසර 15
පරිගණක	වසර 5
උපයෝගිතා	වසර 15

යම් කිසි අයිතමයක් පිළිගනු නොලබනුයේ එය බැහැර කිරීම මත සහ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කල නොහැකි වීම මත ය.වත්කම් පිළිගනු නොලැබීම මත හටගන්නා වාසිය හෝ පාඩුව (ශුද්ධ අපහරණ උත්පාදන සහ වත්කම් වල ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලබන) වත්කම පිළිගනු නොලබන කාලපරිච්ඡේදයේ ලාභ හෝ පාඩු ප්‍රකාශයට අන්තර්ගත කරනු ලැබේ.

මුලින් තක්සේරු කරන ලද කාර්යය සාධන ප්‍රමිතියෙන් බලාපොරොත්තු වන ආර්ථික ප්‍රතිලාභ නැවත පිහිටුවීම හෝ නඩත්තු කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දැරීමට සිදුවිය හැකි වියදමක් ලෙස සැලකේ.

වත්කම් හි අවශේෂ වටිනාකම,ඵලදායී ජීවකාලය සහ ක්ෂය ක්‍රමය එක් එක් මූල්‍ය කාල සීමාව අවසානයේ දී සමාලෝචනය කර, සුදුසු නම් සකස් කරනු ලැබේ.

2.5 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

a) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්-පාරිතෝෂික

සේවකයන් ඒ සඳහා සුදුසුකම් ලැබූ විට විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත.2014 මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා සම්පූර්ණ පාරිතෝෂික ප්‍රතිපාදන සකස් කර ඇති අතර 2017 මාර්තු 31න් අවසන් වූ වසර සඳහා පාරිතෝෂික දීමනාවක් ලබා දී නොමැත.එසේම සැලකිව යුතු විශ්‍රාමික සේවකයන් සංඛ්‍යාවක් නීතිමය ක්‍රියාමාර්ග මගින් ඔවුන්ගේ පාරිතෝෂිකය ඉල්ලා ඇති අතර එම අධිකරණ නඩු තවදුරටත් විභාග වෙමින් පවතී.

b) නිශ්චිත සහභාගී සැලසුම්-සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්ති භාරකාර අරමුදල

අදාළ සංස්ථාපිත රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සේවකයන් සුදුසුකම් ලබයි.සමාගම සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වනු ලබයි.

කෙසේ වෙතත් සමාගමේ ප්‍රතිපත්තිය වූයේ 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරණ සේවා නියුක්ති භාරකාර අරමුදල් පනත යටතේ පිළිගත නොහැකි වන හෙයින්සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්ති භාරකාර අරමුදල කොන්ත්‍රාත් සේවකයින්ගෙන් අඩු නොකිරීමයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

2.6 ඉන්වෙන්ටරි

අභාවිත සහ සෙමින් චලනය වන අයිතම සඳහා ගෙවිය යුතු දීමනා ලබා දීමෙන් පසු, පහල පිරිවැයක් සහ ලබාගත හැකි ශුද්ධ අගයක් සඳහා ඉන්වෙන්ටරි අගයනු ලැබේ. ශුද්ධ උපලබ්ධි කල හැකි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පටිපාටියෙන් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදු කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කිරීමෙනි.

ඉන්වෙන්ටරිය එහි වර්තමාන පිහිටීම සහ තත්ත්වයට ගෙන ඒමට දැරූ පිරිවැය හරිත මධ්‍යන්‍ය තක්සේරු කිරීමේ පදනම සඳහා ගිණුම්ගත කරනු ලැබේ.

2.7 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ ප්‍රකාශ කරනු ලබන්නේ ඒවා ලැබිය යුතු දෑ හි හානිකරණ ශුද්ධ උපලබ්ධිය සඳහා ඒවා ඇස්තමේන්තුගත කර ඇති ප්‍රමාණයන්ගෙනි. වෙනත් ලැබිය යුතු දෑ හඳුනා ගැනෙනුයේ වෙනත් ලැබිය යුතු දෑ හි හානිකරණයෙන් පිරිවැය අඩු කිරීමෙනි.

2.8 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

ප්‍රතිපාදන හඳුනා ගැනෙනුයේ සමාගම සතුව පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්මුතික) පවතින විටය, බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුලත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇතැයි සැලකිය හැකි අතර බැඳීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් සකස් කළ හැකිය.

කාර්යය මණ්ඩලය විසින් ඔවුන්ගේ කාර්ය මණ්ඩල බැඳීම් සහ උසස්වීම් ඉල්ලා සිටීමින් ගොනු කළ නඩු පවතී.ඒවා තවමත් විභාග වෙමින් පවතී.

2.9 ආදායම් ප්‍රකාශය

2.10 අයභාරය හඳුනා ගැනීම

අයභාරය යනු සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාවිතා ප්‍රමාණයට පිළිගැනීම වන අතර දැරීමට සිදුවූ සහ සිදුවන අයභාරය සහ ඒ ආශ්‍රිත පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

අයභාරය මනිනු ලබන්නේ ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමෙනි.

අයභාරය හඳුනා ගැනීමේ අරමුණ සඳහා පහත දැක්වෙන විශේෂ නිර්ණායක භාවිතා කරනු ලැබේ.

a) භාණ්ඩ විකුණුම්

භාණ්ඩ විකුණුම් මගින් අයභාරය හඳුනාගනු ලබන්නේ භාණ්ඩ වල හිමිකමෙහි සුවිශේෂී අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත යොමුකරන ලද විට ය, සාමාන්‍යයෙන් භාණ්ඩය බෙදා හැරීමේදී.

b) පොලිය

අයභාරය හඳුනාගනු ලබන්නේ වත්කම් මත බලපාන පොලී පදනම ගිණුම් සඳහා ගනු ලබන කාල සමානුපාත පදනමක් මත ය.

c) ලාභාංශ

ලාභාංශ ආදායම හඳුනා ගනු ලබන්නේ ගෙවීම ලැබීම සඳහා කොටස්කරුවන්ගේ අයිතිය ස්ථාපිත වූ පසුව ය.

d) වෙනත්

වෙනත් ආදායම් හඳුනා ගනු ලබන්නේ උපචිත පදනමක් මතය.

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

2.11 වියදම් හඳුනාගැනීම

ලාභ සහ අලාභ ප්‍රකාශයේ වියදම් හඳුනාගනු ලබන්නේ දරණ ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමය ඉපයීම අතර වන ඍජු සම්බන්ධය පදනම් කර ගනිමින් ය.ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී දරණ ලද සියළුම වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශය වෙත අයකරගන්නා ලදි.

ලාභ හෝ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා සමාගම විසින් සමාගමේ කාර්යය සාධනයේ අගය සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමේ පදනම මත ,"වියදම් කාර්යය" ක්‍රමය අනුගමනය කර ඇත.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

		2019	*2018*
		රු.	*රු.*
1)	**ආදායම**		
	විකිණුම් ආදායම	4,533,700	322,389
		4,533,700	322,389
2)	**විකිණුම් පිරිවැය**		
	2018.04.01 දිනට තොග	11,664,343	11,864,343
	වසර තුළ නිෂ්පාදන පිරිවැය	5,228,674	-
	ඉවත දමන කඩදාසි වියදම්	160,680	607,850
	2019.03.31 දිනට තොග	(12,490,217)	(11,664,343)
		4,563,480	807,850
3)	**වෙනත් ආදායම්**		
	ප්‍රධාන කාර්යාලයෙන් ලැබුණු ප්‍රදාන-	1,081,538	775,150
	ඉවත දමන කඩදාසි විකුණුම්	16,908,326	25,008,357
	ආපසු නොගෙවන තැන්පතු	7,500	-
	වෙනත් ආදායම්	-	3,000
	පොලී ආදායම	1,950	-
		17,999,314	25,786,507
4)	**පරිපාලන වියදම්**		
	කාර්ය මණ්ඩල වැටුප් සහ ප්‍රසාද දීමනා	9,270,193	10,977,495
	ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ - සේවක අර්ථ සාධක අරමුදල සහ	1,195,225	1,255,588
	- පාරිතෝෂික	-	-
	කුලී සහ වරිපනම්	25,004	957,954
	කාර්යය මණ්ඩල සුභසාධන	112,980	89,537
	කොන්ත්‍රාත් කාර්යය මණ්ඩල දීමනා	-	162,947
	දුරකථන,ෆැක්ස්,භාණ්ඩ ප්‍රවාහන සහ තැපැල් ගාස්තු	184,507	352,206
	මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	26,829	156,521
	අළුත්වැඩියා සහ නඩත්තුව	94,830	94,204
	විගණන ගාස්තු	13,283	-
	නීති සහ වෘත්තීයමය ගාස්තු	43,437	169,028
	ක්ෂය වීම	3,662,944	3,662,944
	විදුලිය සහ බලශක්තිය	162,389	223,716
	ජලය	63,489	70,238
	ලේඛණ කටයුතු පිළිබඳව වියදම්	-	30,000
	පොදු වියදම්	580	14,800
	වන්දි - VRS	-	(2,121,024)
		14,855,689	16,096,153

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

		2018
	රු.	රු.
5) විකුණුම් සහ බෙදා හැරීම් පිරිවැය		
අළුත්වැඩියා සහ නඩත්තුව - වාහන	188,941	322,238
වාහන සඳහා ක්ෂය වීම	1,659,598	1,659,598
ගමන් ගාස්තු හා උපවේශන	36,667	11,465
ප්‍රචාරක වියදම්	-	41,745
	1,885,206	2,035,046
6) මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	33,313	24,742
භාරකාර ණය සහ අයිරා ගැණුම මත පොළිය	-	9,313
	33,313	34,055

7) දේපළ, පිරියත සහ උපකරණ

පිරිවැය	*'.04.2018 දිනට ඉතිරි*	*එකතු කිරීම්*	*අපහරණය*	*1.03.2019 දිනට ඉතිරිය*
ඉඩම් සහ ගොඩනැගිලි	132,274,693	-	-	132,274,693
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	15,954,499	-	-	15,954,499
මෝටර් රථ	26,370,600	-	-	26,370,600
යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	470,973,374	-	-	470,973,374
ක්‍රියාවලියට අදාළ දෑ	87,358,241	-	-	87,358,241
පරිගණක	951,630	-	-	951,630
උපයෝගීතා	105,417,606	-	-	105,417,606
	839,300,644	-	-	839,300,644
ක්ෂය වීම				
ඉඩම් සහ ගොඩනැගිලි	116,272,032	451,015	-	116,723,047
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	15,626,825	15,250	-	15,642,075
මෝටර් රථ	28,562,832	1,659,598	-	30,222,431
යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	449,922,918	2,754,283	-	452,677,201
ක්‍රියාවලියට අදාළ දෑ	86,697,907	2,779	-	86,700,686
පරිගණක	970,512	201,818	-	1,172,331
උපයෝගීතා	105,400,609	237,799	-	105,638,408
	803,453,637	5,322,543	-	808,776,179
ලියා හරින ලද අගය	35,847,007			**30,524,465**

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2019	2018
	රු	රු
8) දීර්ඝ කාලීන ආයෝජන		
මහජන බැංකුව සමග ස්ථාවර තැන්පතු	(2,734,584)	(2,734,584)
කාර්යය මණ්ඩල සුරැකුම් ඉතුරුම්	8,042	8,042
සුරැකුම් තැන්පතු - බැංකුව	14,706	14,706
කම්කරු වන්දි අරමුදල	377,005	377,005
සුරැකුම් තැන්පත් - ජාතික ඉතිරිකිරීමේ බැංකුව	4,087	4,087
ආපදා ණය ගෙවීම සඳහා S/A	29,190	29,190
ස්ථාවර තැන්පතුව - මහජන බැංකුව, මඩකලපුව	11,233	11,233
ස්ථාවර තැන්පතුව - වෛද්‍ය යෝජනා ක්‍රම අරමුදල	323,260	323,260
	(1,967,061)	(1,967,061)
9) ඉන්වෙන්ටරි		
අමුද්‍රව්‍ය	7,086,617	6,260,743
නිම් භාණ්ඩ	5,403,600	5,403,600
අමතර කොටස් සහ මෙවලම්	79,523,390	79,523,390
පාරිභෝජ්‍ය අයිතම	29,632,874	29,632,874
	121,646,480	120,820,606
10) වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ		
වෙළඳ ලැබිය යුතු දෑ	110,235,322	108,379,984
බොල් ණය සඳහා ප්‍රතිපාදන	(2,829,234)	(2,829,234)
	107,406,087	105,550,749
වෙනත් ලැබිය යුතු දෑ (10.1)	236,294,238	236,294,238
තැන්පතු සහ පෙර ගෙවීම් (10.2)	19,430,975	19,574,048
අංශය වෙතින් ලැබිය යුතු දෑ	232,778,140	227,599,102
	595,909,440	589,018,137
10.1) වෙනත් ලැබිය යුතු දෑ		
කාර්යය මණ්ඩල ණයකරුවන්	(193,910)	(193,910)
කාර්යය මණ්ඩල ණයකරුවන්(Issue of Shoes on Sub.)	9,274	9,274
කාර්යය මණ්ඩල ණයකරුවන්(දුරකථන අයකර ගැනීම්)	325	325
ජාතික ආධුනිකත්ව මණ්ඩලය - දීමනාව	46,692	46,692
කාර්යය මණ්ඩල ණයකරුවන් (කුලී සහ විදුලිය)	238,662	238,662
පුද්ගලික කාර්යය	53,331	53,331
වෙනත් ණයකරුවන් (කාර්යය මණ්ඩලය හැර)	30,074,220	30,074,220
රක්ෂණ සංස්ථා හිමිකම්	15,000	15,000
පිරිනැමූ සේවය- සන්නද්ධ හමුදාව	5,336,013	5,336,013
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ජලය ඇ	(9,112)	(9,112)
නියුමන් විෂන් සෙන්ටර්	3,188	3,188
ප්‍රතිපාදන - ඇක්සස් ඉන්ජිනියරින් සමාගම	72,926	72,926
වොන්ලන් ඉදිකිරීම් පුද්ගලික සමාගම	2,057	2,057
ඉදිරියට ගෙන යන ශේෂය	35,648,665	35,648,665

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2019	*2018*
	Rs.	*Rs.*
10.1) වෙනත් ලැබිය යුතු දෑ		
ඉදිරියට ගෙන යන ශේෂය	35,648,665	35,648,665
පෙරහන් යන්ත්‍රෝපකරණ කොන්ත්‍රාත් සේවකයන්	6,137,049	6,137,049
වැටුප් අත්තිකාරම්	2,224,675	2,224,675
බයිසිකල් අත්තිකාරම්	8,750	8,750
උත්සව අත්තිකාරම්	357,870	357,870
ආපදා ණය	119,909	119,909
ආපදා ණය පසුගිය ලැබීම් ගිණුම	15,217	15,217
ගමන් අත්තිකාරම්	96,925	96,925
හදිසි මිලදීගැනීම් සඳහා අත්තිකාරම්	775,938	775,938
කලම්බු පර්වෙසස් සඳහා අත්තිකාරම්	5,992,031	5,992,031
ආනුෂංගික වියදම් සඳහා අත්තිකාරම්	97,717	97,717
ප්‍රතිපාදන - Machine Clothing No: II M/c.	389,031	389,031
ප්‍රතිපාදන - Machine Clothing No: II M/c.	1,445,078	1,445,078
ඉන්ඩෙන්ටු තැන්පතු	882,506	882,506
විවිධ තැන්පතු	21,900	21,900
තැන්පතු P.M.G.(දුරකථන)	53,055	53,055
තැන්පතු හිස් බඳුන්	55,416	55,416
ලැබිය යුතු පොළිය සඳහා ප්‍රතිපාදන	(2,258,808)	(2,258,808)
S.R.M.C.	213,793,727	213,793,727
ඉන්වෙන්ටරි වත්කම්	(36,679,597)	(36,679,597)
භාරකාර ණය සහ අයිරා මත පොළිය සඳහා ප්‍රතිපාදන	7,103,561	7,103,561
තැන්පතු - දුරකථන	13,625	13,625
	236,294,238	236,294,238

10.2) තැන්පතු සහ පෙරගෙවුම්		
කාර්යය මණ්ඩල ණයකරුවන්	36,737	36,737
ආපදා ණය	101,598	101,598
උත්සව අත්තිකාරම්	12,050	12,050
විශේෂ අත්තිකාරම්	3,430	3,430
වාහන ණය	25,850	25,850
වැටුප් ගැලපීම	406	406
වැටුප් අත්තිකාරම්	248,978	444,478
වරාය අධිකාරිය	340,156	340,156
නාවික කටයුතු ඇපය, ඉන්ඩෙන්ටු තැන්පතුව	446,932	446,932
කුලී තැන්පතු	1,007,598	1,007,598
ප්‍රාංකන යන්ත්‍ර තැන්පතු	16,000	16,000
දුරකථන තැන්පතුව	64,879	64,879
තැන්පතුව - සලාකා	3,000	3,000
අත්තිකාරම් තැන්පතු	200,000	200,000
මිලදී ගැනීම් නිශ්කාෂන ගිණුම්	46,921	46,921
ඉන්ඩෙන්ටු නිශ්කාෂන - VCH	191,695	191,695
ඉන්ඩෙන්ටු නිශ්කාෂන - Emb	641,999	641,999
ඉදිරියට ගෙන යන ශේෂය	3,388,228	3,583,728

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2019	*2018*
	රු	*රු*
10.2) තැන්පතු සහ පෙරගෙවීම්		
ඉදිරියට ගෙන ආ ශේෂය	3,388,228	3,583,728
ඉන්ඩෙන්ටු නිශ්කාෂන - VCH-අමතර කොටස්	476,819	476,819
ඉන්ඩෙන්ටු නිශ්කාෂන - - Emb (අමතර කොටස්)	48,605	48,605
වෙනත් තැන්පතු	197,770	197,770
මුදල් අත්තිකාරම් -දේශීය මිලදී ගැනීම්	2,143,538	2,091,111
සාවද්‍ය ගිණුම	1,438,245	1,438,245
සුහසාධක මුදල් අත්තිකාරම්	(1,277,539)	(1,277,539)
පොදු පෙරගෙවීම	246,081	246,081
ගමන් අත්තිකාරම	34,400	34,400
තැන්පතුව - ප්‍රචාරක දැන්වීම් කොන්ත්‍රාත්තුව	5,750	5,750
මිනරල් සැන්ඩස් ලිමිටඩ්	34,260	34,260
රක්ෂණ සංස්ථාව	377,944	377,944
ඒ.සී.ඊ.කාගෝ	9,941	9,941
රජයේ ලෝහ භාණ්ඩ සංස්ථාව	900,000	900,000
ආර්ථික සේවා ගාස්තුව	3,241,368	3,241,368
Prov.Elc. Receivable on H/O.Bld	19,352	19,352
ලැබිය යුතු දුරකථන සඳහා ප්‍රතිපාදන	12,628	12,628
රැඳවුම් බද්ද	7,559,866	7,559,866
අධ්‍යයන චාරිකා	57,631	57,631
සේවා සඳහා අත්තිකාරම	516,088	516,088
	19,430,975	19,574,048
11) මුදල් සහ මුදල් සමාන දෑ		
මහජන බැංකුව - 2479	1,698,668	1,698,668
ජාතික සංවර්ධන බැංකුව (NDB) 316602	84,344	84,344
අත ඇති මුදල්	131,037	131,037
විවිධ ගෙවීම් අග්‍රිමය	225,017	218,967
අයකැමීගේ අග්‍රිමය	4,975	4,975
අග්‍රිමයෙන් සිල්ලර විකිණුම්	3,000	3,000
මුදල් අග්‍රිමය W/P කිරුළපන	73,959	73,959
මුද්දර අග්‍රිමය	21,321	21,321
මහජන බැංකුව - 210898	-	-
මහජන බැංකුවේ ඇති මුදල් - යුනියන් පෙදෙස, කොළඹ	7,931	7,931
මහජන බැංකුවේ ඇති මුදල් - ත්‍රිකුණාමලය ශාඛාව / මඩක	7,591	7,591
සංක්‍රමණ මුදල්	13,500,000	13,500,000
ලංකා බැංකුවේ ඇති මුදල් - මඩකලපුව	651,506	651,506
ලංකා බැංකුව 164807	15,593,539	13,413,090
	32,002,887	29,816,388
12) ප්‍රකාශිත ප්‍රාග්ධනය		
මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබූ ප්‍රකාශිත ප්‍රාග්ධනය	323,000,000	323,000,000
	323,000,000	323,000,000

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

13) පොළී - ණය සහ ණය ගැනුම් දැරීම

13.1) Loans

	1.04.2018 දින වන ඒ	ලබාගත් ණය / Int TFR to P&L	නැවත ගෙවීම්	31.03.2019 දින වන විට
KFW ණය	159,654,648	-	-	159,654,648
පරන්තන් කෙමිකල්ස් - ණය	300,000	-	-	300,000
ලංකා බැංකු ණය ගිණුම් අංක. 7752244	-	-	-	-
ලංකා බැංකු ණය ගිණුම් අංක 77522563	4,064	-	-	4,064
	159,958,713	-	-	**159,958,713**

13.2) මුදල් බදු

	1.04.2018 දින වන ඒ	ලබාගත් බදු	නැවත ගෙවීම්	31.03.2019 දින වන විට
බදු - 8822 : HCLELE1200063800	-	-	-	-
බදු - 8825 : HCLELE1200063700	1,553,398	-	-	1,553,398
බදු - 8709 : HCLELE1200063600	-	-	-	-
	1,553,398	-	-	**1,553,398**

	2019 රු	2018 රු
14) වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ		
වෙළඳ ගෙවිය යුතු දෑ	134,706,146	134,039,935
වෙනත් ගෙවිය යුතු දෑ (14.1)	1,485,771,350	1,483,042,152
ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ (14.2)	45,538,391	45,548,091
	1,666,015,887	1,662,630,179

14.1) වෙනත් ගෙවිය යුතු දෑ

විකුණුම් සමග ගෙවිය යුතු පියවීම්	(4,326,767)	(4,326,767)
ඇඹරුම් යන්ත්‍ර ගෙවිය යුතු	1,435,757	1,435,757
ගණුදෙනුකරු වෙතින් ලද අත්තිකාරම	821,011	821,011
විවිධ ණයකරුවන් - ඉවත දමන කඩදාසි	30,025,166	29,088,114
ගෙවිය යුතු වෘත්තීය සමිති සහ රක්ෂණ	30,362	30,362
විවිධ ණයකරුවන්-පොදු මිලදී ගැනීම්	424,663	424,663
විවිධ ණයකරුවන්- W.P.-පැරණි	5,168,230	5,168,230
කල් ඉකුත් වූ චෙක්පත් ගිණුම	169,319	169,319
විවිධ ණයකරුවන්- කුලී	3,063,323	3,063,323
ප්‍රවාහන කොන්ත්‍රාත්කරු	699,706	699,706
නිශ්කාශන ගාස්තු -V.V. Karunaratne	(150,000)	(150,000)
ගණුදෙනුකරු තැන්පතු	59,783,202	59,783,202
නැවත ලබාදිය හැකි තැන්පතුව	3,208,579	2,738,579
නැවත ලබාදිය හැකි බඳුන් තැන්පතුව	4,417	4,417
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානය	104,900,930	104,900,930
මුදල් ගෙවූ අත්තිකාරම - ඉවත දමන කඩදාසි	825,489	825,489
අමාත්‍යාංශයෙන් ලද ප්‍රදානය	324,784,692	324,784,692
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානය - VCH Boile	23,249,642	23,249,642
ඉදිරියට ගෙන යන ශේෂය	554,117,720	552,710,668

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2019	2018
	රු	රු
14.1) වෙනත් ගෙවිය යුතු දෑ		
ඉදිරියට ගෙන යන ශේෂය	554,117,720	552,710,668
කලින් ගෙවන ලද මුදල්. (අවිනිශ්චිත)	24,500	24,500
වැටුප් පාලන ගිණුම	(1,265,954)	(1,119,722)
වැටුප් පාලන ගිණුම - කොන්ත්‍රාත්	(983,813)	(376,859)
නොගෙවූ වැටුප	113,112	113,112
උපචිත වගකීම්	361,970	361,970
මහ බැංකුව - සේවක අර්ථ සාධක අරමුදල	28,642,875	27,267,960
මහ බැංකුව - සේවක අර්ථ සාධක අරමුදල අධිභාර	12,782,368	12,807,144
සේවා නියුක්ති භාරකාර අරමුදල	(1,622,880)	(2,365,994)
නැවත ගෙවිය හැකි පිරිවැටුම් බද්ද	1,741,638	1,741,638
ගෙවිය යුතු කුලී	14,705,547	14,724,025
ගෙවිය යුතු දුරකථන	(17,892)	(22,860)
ගෙවිය යුතු විදුලිය	175,750	180,292
ගෙවිය යුතු ජලය	(18,776)	(12,796)
උපචිත වැටුප් සහ වේතන, ගමන්	164,539	164,539
අවලංගු වූ සහ ආපසු එවූ චෙක්පත්	156,991	151,691
හිමිකම් නොපෑ වෛද්‍ය ගෙවීම්	900	900
මුදල් විකුණුම් එකතුව	167,630	167,630
මුදල් විකුණුම් එකතුව (R.S.R.)	7,650,641	7,650,641
නිශ්කාෂණ ගාස්තු ඉන්ඩෙන්ටු - අමතර කොටස්	2,367,662	2,367,662
නිශ්කාෂණ ගාස්තු ඉන්ඩෙන්ටු - R.M.	923,247	923,247
මිනරල් සෑන්ඩ්ස් තාවකාලික ණය	5,000,000	5,000,000
අමාත්‍යාංශ ගිණුම	25,578,996	25,578,996
මහා භාණ්ඩාගාරයෙන් ලද ණය	50,000,000	50,000,000
ඩිමෝ - වාහන ගෙවිය යුතු	44,643	44,643
වෛද්‍ය යෝජනා ක්‍රම අරමුදල	26,769	25,533
Pro.සේවක මණ්ඩල හදිසි අනතුරු අරමුදල	7,617,403	7,617,403
Pro.සේවක මණ්ඩල හදිසි අනතුරු අරමුදල	2,079,946	2,079,946
වන්දි සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රදාන	157,689	157,689
කාර්යය මණ්ඩල සුරැකුම් තැන්පතු	4,351	4,351
ප්‍රතිපාදන - උපචිත ගෙවීම්	8,615,267	8,615,267
ණයකරුවන් පාලනය	3,543,441	3,543,441
උපචිත වැටුප් සහ වේතන	3,478,964	3,478,964
Aus ලංකා පුද්ගලික සමාගම	467,972,042	467,972,042
Fines Mills Emp. (ආපසු ගෙවිය හැකි)	147,588	147,588
පොදු නිශ්කාෂණ ගිණුම සේවක අර්ථ සාධක අරමුදල අනිං	982,188	982,188
පොදු නිශ්කාෂණ ගිණුම සේවා නියුක්ති භාරකාර අරමුදල අ	27,801	27,801
නිශ්කාෂණ ගිණුම දහයියා	7,914,294	7,914,294
ලී කුඩු තොග ගිණුම	139,179	139,179
ප්‍රතිපාදන - දඩ	253,876	253,876
ප්‍රතිපාදන - නොමිලේ තේ (Free Tea)	1,378,348	1,378,348
ප්‍රතිපාදන - විලම්බිත වියදම්	25,000	25,000
ඉදිරියට ගෙන යන ශේෂය	1,205,175,563	1,202,445,940

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2019	*2018*
	රු	*රු*
ඉදිරියට ගෙන යන ශේෂය	1,205,175,563	1,202,445,940
ප්‍රතිපාදන-වාහනර් පොම්පාගාරය	263,250	263,250
ප්‍රතිපාදන - පාඩු සහ හානි	264,700	264,700
ප්‍රතිපාදන- අධිභාර CEB	231,282,413	231,282,413
Provision for Labour Filter Plant & VPH	209,836	209,836
උපචිත වැටුප් සහ චේතන	26,281,819	26,281,819
නිමිකම් නොපෑ ගෙවීම්	779,708	779,708
දඩ-මුද්දර	12,375	12,375
විවිධ ණය කරුවෝ - පුද්ගල පඩිනඩි	11,087,261	11,087,261
නොගෙවූ පාරිතෝෂික	152,465	152,465
කාර්ය මණ්ඩල ණයහිමියන්	122,742	122,742
සේවක භාර අරමුදලේ මුදල් ආපසු ගෙවීම	2,882	2,882
නොගෙවූ - ජාතික ආධුනිකත්ව දීමනාව	6,176	6,176
ණයහිමියන්ගේ පාලනය - ඉවතලන කඩදාසි	2,304,974	2,304,974
විවධ ණයහිමියන් - ගෙවීම් සහ වෙනත්	1,681,453	1,681,453
විවධ ණයහිමියන් - තොග පාලනය	(1,776,949)	(1,776,949)
වෛද්‍ය යෝජනා ක්‍රමය	842,074	842,074
කම්කරු වන්දි අරමුදල	4,051,385	4,051,385
කාර්ය මණ්ඩල ආරක්ෂාව	4,087	4,087
සුභසාධන සමිති වට්ටම් ලැබීම	59,239	59,239
තැන්පතු - කොන්ත්‍රාත්කරුවන්	77,400	77,400
ආරක්ෂක තැන්පතු අනියම්	10,000	10,000
තැන්පතු - අභ්‍යන්තර ආපන ශාලාව	25,600	25,600
තැන්පතු - ටෙන්ඩර්	2,117,346	2,117,346
ආරක්ෂක බද්ද	2,000	2,000
අතිරික්ත ගබඩා	8,789	8,789
කුලිය සහ විදුලිය CEB	536,821	536,821
රක්ෂණ මෝටර් රථ	41,906	41,906
පෙර ගෙවූ දුරකථන කුලිය සහ බලපත්‍ර ගාස්තු	50,991	50,991
රෙදි සඳහා විලම්බිත වියදම් සහනාධාරය	68,068	68,068
සුභසාධන සමිති අරමුදල	24,975	25,400
	1,485,771,350	1,483,042,152

14.2) <u>ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ</u>

ගෙවිය යුතු NBT	3,852,090	3,852,090
ගෙවිය යුතු ESC	807,583	807,583
ගෙවිය යුතු ආදායම් බදු	3,291,167	3,291,167
ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු	8,522	8,522
ගෙවිය යුතු මුද්දර ගාස්තු	(7,374)	2,326
ගෙවිය යුතු වැට්	37,586,403	37,586,403
	45,538,391	45,548,091

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2019	*2018*
	Rs.	*Rs.*
15) <u>රජයට ගෙවිය යුතු දෑ</u>		
01.04.2018 දිනට ශේෂය	32,742,616	32,281,832
එකතු කළා :- පාරිතෝෂික	34,063,242	34,524,026
	66,805,858	66,805,858
අඩු කළා:- විශ්‍රාම පාරිතෝෂික අරමුදල ගෙවා ඇති පාරිතෝෂිකය	(34,063,242) -	(34,063,242) -
31.03.2019 දිනට ශේෂය	**32,742,616**	32,742,616
16) <u>බැංකු අයිරා</u>		
මහජන බැංකුව - 210899	150	50
මහජන බැංකුව, වාලව්වේන හි ඇති මුදල්	13,153,218	13,153,218
	13,153,368	13,153,268

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

ආදායම් බදු ගණනය කිරීම

2018/2019 තක්සේරු වර්ෂ සඳ හා

		රු.
ශුද්ධ ලාභය / (අලාභය) බදු පෙර		1,195,325
එකතු කරන්න: තහනම් වියදම්		
ක්ෂය වීම	5,322,543	
නීති ගාස්තු	43,437	
පුණ්ය පරිත්යාගය	-	
විනෝදාස්වාද වියදම්	-	
ප්‍රවාරක වියදම්	-	5,365,980
		6,561,304
අඩු කළා : ක්ෂය වීමේ දීමනා (සටහන-1)	43,338	(43,338)
මුළු මුළු ව්‍යාපාර ආදායම		**6,517,966**
අඩු කළා : පාඩු		
පාඩු B / f සිට 2014/2015		
අලාභය ඉල්ලා සිටී		-
2016/2017 දක්වා C / f අලාභය	-	
තක්සේරු කළ හැකි ආදායම		**6,517,966**
අඩු අඩු කළා : සුදුසුකම් ගෙවීම්		-
බදු අය කළ හැකි ආදායම		**6,517,966**
ගෙවිය යුතු ආදායම් බදු @ 28%		

සටහන 01
ක්ෂය වීමේ දීමනාව

අයිතමය	තක්සේරු වර්ෂය	ප්‍රතිශතය	පිරිවැය	ප්‍රාග්ධන දීමනා
Furniture & fittings	2015/2016	20%	206,699	41,340
Computers	2015/2016	20%	9,990	1,998
				43,338



National Paper Company Limited
No: 61, Stratford Avenue, Colombo 05